ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,415 - 2024 දෙසැම්බර් මස 13 වැනි සිකුරාදා - 2024.12.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

	පිටුව
ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශය ආදිය ...	—
ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ...	2074
අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ...	—
රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය ...	—
අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය ...	—
වෙනත් පත්කිරීම් ආදිය	—
රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය	—
රජයේ නිවේදන	2075
මිල පාලන දැන්වීම්	—
ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම්	—
ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන	—
ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා	2076
විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්	—
නැවියන්ට දැන්වීම්	—
සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම්	—

සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන්, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ජනවාරි මස 03 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 දෙසැම්බර් මස 20 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක් නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය, හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2024 අංක 1055

ජාතික ශිෂ්‍යභට බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීම්

2019 ඔක්තෝබර් මස 15 වැනි දින සිට තාවකාලික ලුතිනන් කර්නල් නිලයට :
නි/5683 මේජර් හේවා වලස්මුල්ලේගේ සුමිත් කුමාර;
නි/5706 මේජර් කෝරලේ ගෙදර මනෝජ් ප්‍රියංකර වීරසේකර;

2020 අගෝස්තු මස 25 වැනි දින සිට තාවකාලික ලුතිනන් කර්නල් නිලයට :
නි/5945 මේජර් සෝමරත්න කන්නාවෙලගේ ජයන්ත ප්‍රේමකුමාර ධර්මසිරි;

2021 සැප්තැම්බර් මස 21 වැනි දින සිට තාවකාලික ලුතිනන් කර්නල් නිලයට :
නි/5356 මේජර් පුවක්පිටියගේ දොන් ප්‍රසන්න අරුණ කුමාර විතානගේ;
නි/5928 මේජර් දිසානායක මුදියන්සේලාගේ සමන්ත බණ්ඩාර දිසානායක;

2022 අගෝස්තු මස 31 වැනි දින සිට තාවකාලික ලුතිනන් කර්නල් නිලයට :
නි/4849 මේජර් වැලිකල අප්පුහාමිලාගේ දොන් ජගත් විශ්වමූර්ති පීටර් වැලිකල;

2022 සැප්තැම්බර් මස 30 වැනි දින සිට තාවකාලික ලුතිනන් කර්නල් නිලයට :
නි/5247 මේජර් සෙල්ලප්පුලිගේ ටයිටස් ජෙරාඩ් සෙන්ස්ටන්ස් රෝසා;

2022 දෙසැම්බර් මස 31 වැනි දින සිට තාවකාලික ලුතිනන් කර්නල් නිලයට :
නි/4126 මේජර් රාජපක්ෂ පතිරන්නැහැලාගේ ඉන්දික පුෂ්පකුමාර;
නි/4845 මේජර් ගමාරච්චි පතිරණගේ අජිත් සමන්ත පතිරණ;
නි/5375 මේජර් දිසානායක මුදියන්සේලාගේ සෙනවිරත්න බණ්ඩාර දිසානායක;
නි/5696 මේජර් කරුණාරත්නගේ ප්‍රියන්ත ගමගේ;
නි/5935 මේජර් අබේකෝන් විජයපක්ෂ නාරායන මුදියන්සේලාගේ සරත් කුමාර අබේකෝන්;
නි/5939 මේජර් වැලිවේරිය ලියනගේ කුශාන් ඉන්ද්‍රජිත් ලියනගේ;
නි/5946 මේජර් බම්මනගේ උපාලි තිලකරත්න;
නි/6039 මේජර් බෝයගම රාලලාගේ චන්ද්‍රකාන්ත ජයරත්න;
නි/6044 මේජර් රාජපක්ෂ දිසානායකලාගේ අජිත් සමන් රාජපක්ෂ;
නි/6045 මේජර් හේවා ගීගනගේ ලලිත් ප්‍රියන්ත;
නි/6055 මේජර් වජිර ප්‍රසන්න ප්‍රේමරත්න විදානපතිරණ;
නි/6062 මේජර් ප්‍රදීප් නිශ්ශංක අමරසිංහ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

එයාර් වයිස් මාර්ෂල් සම්පත් තුයියකොන්තා (විශ්‍රාමික),
ඩබ්ලිව්ඩබ්ලිව්වී, ආර්ඩබ්ලිව්පී (තෙවරක්), ආර්එස්පී (දෙවරක්), යූඑස්පී,
එම්එම්එස්සී (උපායමාර්ගික අධ්‍යයන-චීනය),
එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ, එම්එස්සී
(ආරක්ෂක හා උපායමාර්ගික අධ්‍යයන), එෆ්එන්ඩීයූ (චීනය), පීඑස්සී.
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2024 නොවැම්බර් මස 12 වැනි දින.
කොළඹ දී ය.

12 - 165

රජයේ නිවේදන

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

මගේ යොමු අංකය - ED/ST/BUD/8/1/4/8/1.

1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26, 27 සහ 33 වැනි වගන්ති යටතේ සාදන ලද 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 03 (06) (අ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිඕවිට ශ්‍රී සුශිලෝදය පිරිවෙන් විහාරස්ථානයේ කෑ/දෙහි ශ්‍රී සුශිලෝදය මූලික පිරිවෙන ආරම්භ කොට ඇති බැවින් එය විධිමත් පරිදි ලියාපදිංචිකර දෙන මෙන් එහි කෘත්‍යාධිකාරී ස්වාමීන් වහන්සේ වන පූජ්‍ය අඹන්වල හේමාලංකාර ස්වාමීන්වහන්සේ ඉල්ලීම් කර තිබේ. ඒ අනුව 198 පිරිවෙන් අධ්‍යාපන මණ්ඩලය විසින් නව පරිවේණාචාර්ය මණ්ඩලයක් ලබා නොදීමේ පදනම මත උක්ත පිරිවෙන ලියාපදිංචි කිරීමට අනුමැතිය ලබා දී ඇත. එබැවින් එකී පිරිවෙන 2023.10.20 දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 03(06) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත් මෙම දැන්වීම පළ වී දින තිහක් (30ක්) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

නාලක කලුවැව,
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

2024 නොවැම්බර් මස 29 වැනි දින,
බත්තරමුල්ල,
ඉසුරුපාය,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

12 - 131

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

කඳාන සාන්ත සෙබස්තියන් ජාතික සිද්ධස්ථානයේ වාර්ෂික මංගල්‍යය - 2025

ගම්පහ දිස්ත්‍රික්කය

කඳාන සාන්ත සෙබස්තියන් ජාතික සිද්ධස්ථානයේ වාර්ෂික මංගල්‍යය 2025.01.20 දින පැවැත්වෙන බවත්, 2025.01.03 දින සිට 2025.01.31 දින දක්වා මංගල්‍යය පැවැත්වෙන කාල සීමාව ලෙස පොදු මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

1. මේ පිළිබඳව 175 අධිකාරය වූ වන්දනා ගමන් ආඥාපනත යටතේ 2019.08.06 වැනි දින අංක 2135/34 දරන අති විශෙෂ *ගැසට්* පත්‍රයේ පළකර ඇති නියෝග පිළිබඳව පොදු මහජනතාවගේ අවධානය යොමු කරවනු ලැබේ.

2. ප්‍රසිද්ධියට පත් කරන ලද මෙම නීති රෙගුලාසි මෙම උත්සවය පැවැත්වෙන කාල සීමාව තුළ වලංගුවනවා ඇත.

ලලින්ද ගමගේ,
දිස්ත්‍රික් ලේකම්/ දිසාපති,
ගම්පහ.

2024 දෙසැම්බර් මස 06 වැනි දින,
ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

12 - 203

ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

ජාතික විගණන කාර්යාලය

උපකුලපති,
මොරටුව විශ්වවිද්‍යාලය.

මොරටුව විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මතය :**

මොරටුව විශ්වවිද්‍යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උපවගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මතය සඳහා පදනම :**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු :**

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිඳු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේ දී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමග හෝ විගණනයේ දී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

විශ්වවිද්‍යාලයේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශ්වයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශ්වයන්ගේ වගකීම් :**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක්වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලයේ ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ

වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශ්වයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උපවගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම :

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිට ම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම් ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකි ය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව :

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිළි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධ වී ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව යම් සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති/ විධානයට යොමුව	*නිරීක්ෂණය*
(අ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(ආ) ඡේදය	වටිනාකම රු. 1,407,600 ක්වූ ශ්‍රවනාගාර පුටු සපයා සවිකිරීමේ ප්‍රසම්පාදනය සඳහා සාර්ථක ලංසුකරු සමඟ විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ නොතිබුණි.
(ආ)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ	
(i)	2016 මාර්තු 01 දිනැති 04/2016 දරන කොමිෂන් සභා චක්‍රලේඛයෙහි 5.1.6 ඡේදය	විශ්වවිද්‍යාල ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ඉපයූ ආදායමෙන් සියයට 0.01ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත බැර කළ යුතු වුවද 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම්වලින් උපයන ලද ආදායමෙන් රු. 333,238ක් කොමිෂන් සභාව වෙත යවා නොතිබුණි.
(ii)	2022 ජනවාරි 03 දිනැති අංක 01/2022 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයෙහි 4 (ii) ඡේදය	පොත් 100,001 ට වැඩියෙන් පවතින පුස්තකාලවල අංශ අනුව කරන ලද වාර්ෂික සත්‍යාපනය වර්ෂ 03කදී අවසන්කළ යුතු වුවද පරිග්‍රහන ලේඛනය අනුව පොත් 114,758ක් පවතින පුත්තකාලයේ 2013 වර්ෂයේ සිට වාර්ෂිකව පොත් සමීක්ෂණය කර නොතිබුණි.
(iii)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය.	විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යමණ්ඩලයේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව සමලෝචිත වර්ෂය සඳහා රු. 2,017,672,383 ක් වැටුප් හා දීමනා ගෙවා තිබුණි.
(ඇ)	1971 අංක 38 මුදල් පනතේ II වන වගන්තිය සහ 2019 ජුලි 29 දිනැති අංක 04/2019 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අභ්‍යන්තර විගණන චක්‍රලේඛ ලිපිය.	මූල්‍ය කමිටු නිර්දේශය අනුව සමාලෝචිත වර්ෂයේ සිදු කළ රු. 902,200,000ක් ආයෝජන සඳහා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු :

(අ) නාගරික සංවර්ධන අධිකාරියට අයත් පර්චස් 12ක් 2009 ඔක්තෝබර් 14 දිනැති අංක 1494 දරන කල්බදු ගිවිසුම යටතේ රු. 1,400,000 ක පිරිවැයක් දරා වර්ෂ 50 ක කාලයක් සඳහා බද්දට ගෙන තිබුණි. ඉඩමෙහි සංවර්ධන කාර්යයන් ගිවිසුමේ දින සිට මාස 06 කින් ආරම්භ කර අවුරුදු 02ක් තුළ නිම කිරීමට අපොහොසත් වුවහොත් බදු ගිවිසුම ස්වයංක්‍රීයව අවලංගු වී ඉඩමෙහි සන්තකය බදු හිමියාට අයිති වන බව බදු ගිවිසුමෙහි සඳහන්වීම හේතුවෙන් විශ්වවිද්‍යාලය ඒ අනුව කටයුතු කර නොතිබීම නිසා ගිවිසුම අවලංගු වී ඇති බව 2018 පෙබරවාරි 27 දින නාගරික සංවර්ධන අධිකාරියේ ලිපියෙන් දැනුම් දී තිබුණි. ඒ අනුව ඉඩම බද්දට ගැනීමට දරන ලද රු. 1,400,000 ක් ආර්ථික නොවන වියදමක් වී තිබුණි.

(ආ) 2019 වර්ෂයට පෙර මිල දී ගෙන තිබුණු රු. 2,894,247ක් වටිනා ටෝනර් සහ කාට්‍රිජ් 346ක් ඉදිරියේ දී අවශ්‍ය අංශයන් වෙත නිකුත් කිරීමත් හා භාවිතයට ගත නොහැකි තොග ඉවත් කර ගැලපීම් කරන බවත් ඉකුත් වර්ෂයේ දී විගණනයට දැනුම් දී තිබුණ ද 2023 අප්‍රේල් දක්වා ම ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2020 වර්ෂයට පෙර මිල දී ගත් ප්‍රාග්ධන භාණ්ඩවලට අදාළව රැඳවුම් මුදල් රු. 2,155,052 ක් හා 2012 සහ 2014 වර්ෂවල දී නිම කරන ලද කොන්ත්‍රාත් 03ක රැඳවුම් මුදල් රු. 2,429,936 ක් 2022 දෙසැම්බර් 31 දින වන විට ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ගිවිසුම් හා බැඳුම්කර කඩකළ ආචාර්යවරුන් 29 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු. 62,969,142ක් තුළ වර්ෂ 21ත් වර්ෂ 30ත් අතර කාලයක සිට පැවත එන නිලධාරින් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 5,074,425ක් සහ වර්ෂ 31 ත් වර්ෂ 41 ත් අතර කාලයක සිට පැවත එන නිලධාරින් 05 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 1,908,708ක් ඇතුළත් වී තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව දෙපාර්තමේන්තු සංවර්ධන අරමුදල යටතේ ගිණුම් 53 ක රු. 179,311,051ක් ද, පාඨමාලා සංවර්ධන අරමුදල යටතේ ගිණුම් 36ක රු. 72,548,888 ක් ද ඌන උපයෝජිතව පැවතුණි. ඉන් ගිණුම් 18ක පැවති එකතුව රු. 6,040,365 ක් අවුරුදු 06ක සිට හා ගිණුම් 13ක එකතුව රු. 9,267,103ක් සමාලෝචිත වර්ෂය තුළ දී ද උපයෝජනය කර නොතිබුණි.

(ඊ) 2022 දෙසැම්බර් 31 දිනට වර්ෂ 03 සිට වර්ෂ 12 අතර කාලයක සිට පවතින එකතුව රු. 25,248,414 ක් වූ ශිෂ්‍යත්ව අරමුදල් 30ක් කිසිදු ශිෂ්‍යත්වයක් පිරිනැමීමකින් තොරව අක්‍රීයව පැවතුණි.

(උ) ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා අරමුණු කර ගෙන දීර්ඝ කාලයක සිට අක්‍රීයව පවතින ශිෂ්‍යත්ව අරමුදල්වලින් රු. 13,602,546ක් 2020 හා 2021 වර්ෂ තුළ දී සම්මාන සහ ශිෂ්‍යත්ව (Awards & Scholarship Account) නමින් නව අරමුදලකට බැර කර තිබුණ ද ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා අවශ්‍යවන්නා වූ නිර්ණායක සකස් කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ දී ද මෙම අරමුදල ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.

(ඌ) 2022 දෙසැම්බර් 31 දිනට මොරටුව විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැවති පුරප්පාඩු සම්පූර්ණ කර නොගැනීම හේතුවෙන් බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගෙන සමාලෝචිත වර්ෂයේ දී රු. 38,730,873 ක දීමනා ගෙවා තිබුණි.

(එ) දෙපාර්තමේන්තු 03ක ස්වයං මූල්‍ය පාඨමාලාවන් සඳහා ශිෂ්‍යයින් බඳවා ගැනීමේ යෝග්‍යතා පරීක්ෂණවලට සම්බන්ධ වුවන් සඳහා ගෙවිය යුතු රු. 10,584,513ක් සමාලෝචිත වර්ෂය අවසානයේ දී ද නිරවුල් කිරීමට අපොහොසත් වී තිබුණි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න,
විගණකාධිපති.

2022 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2022	2021 (නැවත ප්‍රකාශිත)	2021 (විගණනය කළ)
		රු. ශත	රු. ශත	රු. ශත
වත්කම්				
ජංගම නොවන වත්කම්				
දේපළ, පිරියත සහ උපකරණ	3	8,791,422,841	8,954,200,171	9,158,478,283
අස්පෘශ්‍ය වත්කම්	4	10,476,153	7,076,365	7,076,365
නොනිම් වැඩ	5	800,006,666	639,943,510	747,555,748
		9,601,905,660	**9,601,220,046**	**9,913,110,396**
ජංගම වත්කම්				
තොග	6	26,432,041	23,272,351	23,272,351
ආයෝජන	7	1,902,499,871	966,889,570	966,889,570
කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්	8	35,709,829	37,767,903	37,767,903
ලැබිය යුතු	9	171,757,849	15,331,814	15,331,814
පෙර ගෙවීම්		8,314,917	8,302,710	8,302,710
ප්‍රාග්ධන අත්තිකාරම්	10	76,866,308	110,637,675	289,751
මුදල් සහ මුදල් හා සමාන දේ	11	512,233,716	1,227,332,235	1,227,332,235
		2,736,814,531	**2,389,534,258**	**2,279,186,334**
මුළු වත්කම්		**12,338,720,191**	**11,990,754,304**	**12,192,296,729**
වගකීම්				
ජංගම වගකීම්				
ගෙවිය යුතු	12	209,108,434	134,644,445	134,644,445
ගෙවිය යුතු තැන්පතු	13	23,400,408	22,576,445	22,576,445
උපචිත වියදම්	-	136,735,421	98,154,256	98,154,256
විලම්බිත ආදායම්	14	919,769,273	929,398,599	912,468,773
		1,289,013,535	**1,184,773,745**	**1,167,843,919**
ජංගම - නොවන වගකීම්				
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්	15	807,324,732	749,941,352	749,941,352
		807,324,732	**749,941,352**	**749,941,352**
මුළු වගකීම්		**2,096,338,267**	**1,934,715,097**	**1,917,785,271**
ශුද්ධ වත්කම්		10,242,381,924	10,056,039,207	10,274,511,458

		2022	*2021*	*2021*
			(නැවත ප්‍රකාශිත)	*(විගණනය කළ)*
		රු.	*රු.*	*රු.*
ශුද්ධ වත්කම්/ හිමිකම්				
ප්‍රාග්ධන ප්‍රදාන - වැය නොකළ	16	-	98,496,274	98,496,274
සමුච්චිත අරමුදල - පුනරාවර්තන		2,730,378,591	2,398,881,999	3,337,904,404
සමුච්චිත අරමුදල - ප්‍රාග්ධන	17	945,626,459	1,059,966,123	-
උත්පාදිත අරමුදල් ප්‍රාග්ධනය	18	-	-	46,716,070
පර්යේෂණ ප්‍රදාන	19	107,007,633	111,040,968	127,970,794
		3,783,012,684	**3,668,385,364**	**3,611,087,543**
සංචිත				
ප්‍රත්‍යාගණන සංචිතය		5,168,551,357	5,168,551,357	5,444,321,430
ක්‍රීඩා සංවර්ධන සංචිතය		1,624,664	1,541,168	1,541,168
		5,170,176,021	**5,170,092,525**	**5,445,862,598**
අරමුදල්				
සීමා කළ අරමුදල්	20	1,245,050,981	1,176,107,957	1,176,107,957
පරිත්‍යාග අරමුදල	21	44,142,238	41,453,360	41,453,360
		1,289,193,219	**1,217,561,317**	**1,217,561,317**
මුළු ශුද්ධ වත්කම්/ හිමිකම්		**10,242,381,924**	**10,056,039,207**	**10,274,511,458**

පිටුව 6 සිට 29 දක්වා දිස්වන සටහන් මූල්‍ය ප්‍රකාශවල අවශ්‍ය කොටසකි.
මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා පාලක සභාව වග කියයි.
පාලක සභාව වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලද්දේ

මහාචාර්ය එන්. ඩී. ගුණවර්ධන,
උපකුලපති,
ගිණුම්කරණ නිලධාරී.

ආචාර්ය ඩී. පී. චන්ද්‍රසේකර,
නියෝජ්‍ය උපකුලපති.

ඩී. එල්. ඩී. ජයන්ත,
ලේඛකාධිකාරී,
සහකාර ගිණුම්කරණ නිලධාරී.

කේ. ඒ. ඩී. පුෂ්පකීර්ති,
මූල්‍යාධිකාරී.

(ඉංග්‍රීසි පිටපතේ අත්සන් යොදා ඇත.)

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2022	2021
		රු. ශත	රු. ශත
ආදායම			
(අ) පුනරාවර්තන ආදායම			
විනිමය නොවන ගනුදෙනුවලින් පුනරාවර්තන ආදායම			
රජයේ පුනරාවර්තන ප්‍රදානය		3,317,000,000	3,185,000,000
UGC ප්‍රදානය		5,000,000	-
ශිෂ්‍යාධාර		13,592,000	10,160,000
පරිත්‍යාග ශිෂ්‍යත්ව		175,000	80,000
බාහිර පර්යේෂණ ප්‍රදාන ආදායම		28,629,756	25,209,324
		3,364,396,756	3,220,449,324
විනිමය ගනුදෙනුවලින් පුනරාවර්තන ආදායම			
ශිෂ්‍යයන්ගෙන් ආදායම්	22	15,824,533	16,316,720
පොළී ආදායම	23	231,987,174	56,964,988
වෙනත් ආදායම්	24	22,715,206	21,549,973
පිරිවැය ප්‍රතිසාධන ක්‍රියාකාරකම්වලින් ලැබීම්	37	682,230,502	557,802,738
		952,757,416	652,634,419
මුළු පුනරාවර්තන ආදායම		4,317,154,172	3,873,083,743
(ආ) ප්‍රාග්ධන ආදායම			
විනිමය නොවන ගනුදෙනුවලින් ප්‍රාග්ධන ආදායම			
ප්‍රාග්ධන ප්‍රදානය	25	309,545,263	453,857,188
ප්‍රාග්ධන පරිත්‍යාග	26	75,892,809	76,206,822
		385,438,071	530,064,010
විනිමය ගනුදෙනුවලින් ප්‍රාග්ධන ආදායම			
උත්පාදිත අරමුදල් ප්‍රාග්ධන දායකත්වය	27	173,871,215	2,986,440
		173,871,215	2,986,440
මුළු ප්‍රාග්ධන ආදායම		559,309,286	533,050,449
මුළු ආදායම (a+b)		4,876,463,458	4,406,134,193

	සටහන	2022	2021
		රු. ශත	රු. ශත
(ඇ) මෙහෙයුම් වියදම්			
පුද්ගල වේතන	28	(2,846,363,065)	(2,644,040,755)
ගමන් සහ යැපීම් වියදම්	29	(13,033,876)	(2,832,527)
සුබසාධන සේවා	30	(48,813,508)	(34,121,896)
වෙනත් මෙහෙයුම් වියදම්	31	(144,557,240)	(68,665,811)
ශිෂ්‍යයන්ට මූල්‍ය සහාය	32	(13,767,000)	(10,240,000)
කොන්ත්‍රාත්තුමය සේවා	33	(205,775,255)	(195,312,225)
සැපයුම් සහ පරිභෝජන	34	(64,381,447)	(41,802,573)
නඩත්තු	35	(66,157,078)	(40,497,092)
මූල්‍ය පිරිවැය	36	(6,500)	(6,880)
බාහිර පර්යේෂණ ප්‍රදාන වියදම්		(28,629,756)	(25,209,324)
පිරිවැය ප්‍රතිසාධන ක්‍රියාකාරකම් මත වියදම	37	(682,230,502)	(557,802,738)
		(4,113,715,225)	**(3,620,531,820)**
(ඈ) මෙහෙයුම් නොවන වියදම්			
ක්ෂය		(621,526,459)	(570,606,218)
අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය		(1,751,037)	(921,354)
අධ්‍යයන පර්යේෂණ		(50,371,453)	(43,585,178)
		(673,648,950)	**(615,112,750)**
මුළු වියදම (c+d)		(4,787,364,176)	(4,235,644,570)
(ඉ) කාල පරිච්ඡේදය සඳහා පුනරාවර්තන අතිරික්තය/ (හිඟය) (a+c)		**203,438,946**	**252,551,923**
(ඊ) කාල පරිච්ඡේදය සඳහා පුනරාවර්තන අතිරික්තය/ (හිඟය) (b-d)		**(114,339,664)**	**(82,062,301)**
කාල පරිච්ඡේදය සඳහා මුළු අතිරික්තය/ (හිඟය) (e+f)		**89,099,282**	**170,489,623**

මහාචාර්ය එන්. ඩී. ගුණවර්ධන,
උපකුලපති,

ආචාර්ය ඩී. පී. චන්ද්‍රසේකර,
නියෝජ්‍ය උපකුලපති.

ඩී. එල්. ඩී. ජයන්ත,
ලේඛකාධිකාරි,

කේ. ඒ. ඩී. පුෂ්පකීර්ති,
මූල්‍යාධිකාරි.

(ඉංග්‍රීසි පිටපතේ අත්සන් යොදා ඇත.)

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන	*2022*	*2021*
		රු. ශත	*රු. ශත*
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ			
සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් අතිරික්තය/(හිඟය)		89,099,282	170,489,623
ගැළපුම්			
ක්ෂය	3	621,526,459	570,606,218
අස්පෘශ්‍ය වත්කම්වල ක්‍රමක්ෂය	4	1,751,037	921,354
රජයේ ප්‍රදාන/උත්පාදිත සහ පරිත්‍යාග (ප්‍රාග්ධනය) ක්‍රමක්ෂය	25/26/27	(559,309,286)	(533,050,449)
පෙර වසරට අදාළ ආදායම සහ වියදම් (ක්ෂය, බැහැර කිරීම් ගැළපුම් සමඟ) (උපලේ. 9-12)		131,108,992	79,048,726
පොළී ආදායම	23	(231,987,174)	(56,964,988)
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්	15	107,782,891	37,487,076
මූල්‍ය පිරිවැය	36	6,500	6,880
කාරක ප්‍රාග්ධනයේ වැඩිවීම/ අඩුවීම			
තොගවල වැඩිවීම/ අඩුවීම	5	(3,159,690)	5,563,800
වෙනත් ජංගම වත්කම්වල වැඩිවීම/ අඩුවීම		(153,339,758)	(56,045,533)
ජංගම වගකීම්වල වැඩිවීම/ අඩුවීම		104,239,790	145,319,093
පර්යේෂණ ප්‍රදානවල වැඩිවීම/ අඩුවීම		(4,033,335)	11,654,157
ණය පොළී සහ කාර්ය මණ්ඩල අත්තිකාරම්	23	1,512,822	1,697,512
ගෙවූ පාරිතෝෂික		(50,399,512)	(55,152,369)
ගෙවූ මූල්‍ය පිරිවැය	36	(6,500)	(6,880)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ		**54,792,518**	**321,574,219**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ			
දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම (රජයේ ප්‍රදාන)	3	(203,475,852)	(133,387,460)
දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම (උත්පාදිත අරමුදල්)	3	(167,921,186)	(2,845,929)
දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම (ප්‍රදාන)	3	(75,892,809)	(76,206,822)
ආයෝජන ඉවත්කර ගැනීම	7	-	705,000
නොනිම් වැඩවල වැඩිවීම/ අඩුවීම	5	(149,993,653)	(208,236,463)
නව ආයෝජන	7	(902,200,000)	(4,791,769)
ආයෝජනවලින් සමුච්චිත පොළී (දිගු කාලීන)	7	(33,410,300)	(24,401,825)

	සටහන	2022	2021
		රු. ශත	රු. ශත
පරිත්‍යාග අරමුදල සඳහා ලද බැංකු පොළී	21	2,687,563	2,247,992
ආයෝජනවලින් පොළිය	23	230,474,353	55,267,476
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ		**(1,299,731,885)**	**(391,649,800)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ			
භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රදාන		140,200,000	374,850,000
අතිරේක බඳවා ගැනීම් සඳහා UGC ප්‍රදානය		15,000,000	-
AHEAD ව්‍යාපෘතියෙන් ලද අරමුදල්		55,848,988	129,761,265
මොරටුව විශ්වවිද්‍යාලයේ උසස් ඉලෙක්ට්‍රොනික නිර්මාණ මධ්‍යස්ථානය පිහිටුවීමෙන් මාරු කළ අරමුදල්		-	1,397,423
PPE මිලදී ගැනීමට උත්පාදිත ආදායමෙන් අරමුදල්	27	173,871,216	2,986,440
PPE අත්පත් කර ගැනීම සඳහා ප්‍රදාන	26	23,263,323	23,103,244
වැයකළ ප්‍රාග්ධන ගිණුමට මාරු කිරීම		-	523,724
PPE අත්පත් කර ගැනීම සඳහා AHEAD ශුද්ධ ප්‍රදානය	26	52,629,486	53,103,577
පරිත්‍යාග අරමුදලෙන් ත්‍යාග ගෙවීම්	21	(2,198,685)	(2,056,830)
පරිත්‍යාග අරමුදලට ලාභ	21	2,200,000	10,500,000
සීමා කළ අරමුදල්වලට ලාභ	20	434,384,863	378,319,576
සීමා කළ අරමුදලෙන් ගෙවීම්	20	(365,441,840)	(197,660,239)
ක්‍රීඩා සංවර්ධන සංචිතයේ ශුද්ධ වැඩිවීම		83,496	58,019
		529,840,848	**774,886,199**
මුදල් සහ මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		(715,098,519)	704,810,619
කාලපරිච්ඡේදය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දෑ		1,227,332,235	522,521,617
කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ		**512,233,716**	**1,227,332,235**

12-138